**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව - 2015**

**--------------------------------------------**

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් සහ වියදම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් සහ වියදම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

**----------------**

## 2.1 මතය ව්‍යාචනය

---------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) සමාලෝචිත වර්ෂයට අදාල ජංගම නොවන වත්කම් විකුණුම් ලාභය වූ රු.243,945 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස්කිරීමේදී සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තුල්‍යතාවය විගණනයේදී ගැටළු සහගත විය.

(ii) සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් සඳහා ලබාදුන් ආපදා ණය සඳහා පොළී ලැබීම් රු.992,010 ක් ආයෝජන කටයුතු මගින් ජනනය වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්වීම වෙනුවට මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

(iii) රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු. 110,000,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය කටයුතු යටතේ ඉදිරිපත් කළ යුතු වුවත් එය ආයෝජන කටයුතු යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

**(i)** යම් වත්කමක් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ දිනයේ සිට වත්කමේ ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය මුළුල්ලේ ක්‍රමානුකූල පදනමක් මත බෙදාහල යුතු වුවද සංස්ථාව විසින් වත්කම් මිලදීගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන් ක්ෂය කිරීමේ හා විකුණුම් කළ වර්ෂයේදී ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

**(ii)** වත්කමක සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් ඇතිවිට වත්කම් සෑම වසර 3 කට හෝ වසර 5 කට වරක් ප්‍රත්‍යාගණනයන් කිරීම ප්‍රමාණවත් වුවද , සංස්ථාව විසින් 2007 න් පසුව වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අඩමාණ ණය ලෙස රු.10,171,194 ක් වෙන්කර තිබුණද , වෙන්කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) පරිගණක යන්ත්‍රවල ආයු කාලය නොසලකා කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් කාර්යාල උපකරණ වෙනුවෙන් වූ සියයට 10 ක් වූ ක්ෂය ප්‍රතිපාදනයම පරිගණක යන්ත්‍ර සඳහා අනුගමනය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවට අයත් ශීතාගාර , අයිස් යන්ත්‍රාගාර, ඉඩම්, ලිස්සුම් මග වැනි වත්කම් බදු දීම තුලින් රු.57,028,377 ක බදු ආදායමක් උපයා තිබුණද එම ආයෝජන වත්කම්වල පිරිවැය හෝ සාධාරණ අගය ගිණුම්ගත කිරීම සඳහා ප්‍රතිපත්තියක් හඳුනා නොගෙන, දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

ඉකුත් වර්ෂය තුළ සේවයෙන් ඉවත්වූ සේවකයකු වෙත ගෙවන ලද පාරිතෝෂික මුදල් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ආපසු එවන ලද රු.421,458 ක් වූ චෙක්පත් පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමට බැරකර තිබුණි. තවද වර්ෂය අවසානයට එම සේවකයා වෙනුවෙන් පාරිතෝෂික වෙන්කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ පාරිතෝෂික වෙන් කිරීම් හා පාරිතෝෂික ගෙවීම් ගිණුම් වලට අදාලව මූල්‍ය ප්‍රකාශන හා ලෙජර් ගිණුම අනුව පිළිවෙලින් රු.83,040 ක හා රු. 338,418 ක වෙනස්කම් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව ගිණුම් 07 කට අදාළව බැංකු ශේෂය හා සංශෝධිත මුදල් පොත්වල දැක්වෙන ශේෂයන් අතර රු.13,367,774 ක වෙනසක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| යන්ත්‍ර | 255,966,576 | විස්තරාත්මක උපලේඛන |
| උපකරණ | 99,705,372 | |
| පොම්ප් ප්‍රීව්ඩ් ලැබීම් | 2,215,769 | |
| විලම්භිත බැරකම් | 1,653,400 | |
| ලියා හැරිය යුතු ශේෂ | 81,769,596 | |
| එකතුකල අගය මත බදු | 33,933,412 | |
| විවිධ ණයගැතියෝ | 1,745,385 | කාල විශ්ලේෂණ |
| ණයගැතියෝ | 9,851,476 | |
| ලැබිය යුතු රඳවාගැනීමේ බදු | 914,980 | කාල විශ්ලේෂණ හා විස්තරාත්මක උපලේඛන |
| රඳවාතබාගැනීමේ බදු | 1,611,054 | |
| අයභාර වියදම් | 2,459,127 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මිලදීගැනීම් සඳහා ගෙවූ අත්තිකාරම් රු.36,867,510 ක මුදලින් වසර 10 ට වැඩි , වසර 05 ට වැඩි සහ වසර 01 සිට වසර 05 දක්වා වූ ශේෂයන් පිළිවෙලින් රු.24,492,699 ක් , රු.5,860,711 ක් සහ රු.6,514,100 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.313,325,719 ක ණයගැති වටිනාකම තුළ වසර 05 ට වැඩි , වසර 03 ට වැඩි සහ වසර 01 ත් වසර 05 ත් අතර දක්වා වූ ශේෂයන් පිළිවෙලින් රු.124,167,764, රු.35,385,439 ක් සහ රු.125,247,632 ක් විය.

(ඇ) වසර 05කට අධික කාලයක සිට පැවත එන රු.81,769,596 ක් වූ හඳුනානොගත් ගිණුම් ශේෂයක් හා එකතු වටිනාකම රු.111,954,599 ක් වූ අත්තිකාරම්, ණයහිමියෝ සහ තැන්පතු සමාලෝචිත වර්ෂයේදිද නිරවුල් කර නොතිබුණි.

(ඈ) වසර 04 ක කාලයක සිට පැවත එන ආර්ථික සේවා බදු රු.10,512,971 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු වෙනත් තැන්පතු රු.4,509,025 ක් වසර 05 කට අධික කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

(ඊ) සේවක ආපදා ණය ශේෂය තුළ 2013 වර්ෂයේ සිට පැවත එන රු.808,019 ක ණය ශේෂයක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 | 2015 ඔක්තෝබර් 28 දින සංස්ථාවේ බස්රථයට අනතුරකින් සිදුවූ අලාභ හානියෙහි ප්‍රමාණය සහ ඊට හේතු වූ කරුණු හා වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර ගැනීම සඳහා මූලික පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 137(5) | භාණ්ඩ ලැබුණු බවට සනාථකර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුලදී ටී ෂර්ට් 600 ක් සඳහා පෞද්ගලික ආයතනයකට රු.470,470 ක් ගෙවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | |
|---|---|
| **(i)** 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | එකතු වටිනාකම රු.4,929,662,403 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| **(ii)** 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | වටිනාකම රු.99,705,372 ක් වූ පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන චක්‍රලේඛය | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරීන් සඳහා හිමි රු.15,000 ක දීමනාවට, හිමිකම් නොමැති ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට ඇතුළත් නොවන සංස්ථාවේ ඉංජිනේරුවරුන් 07 දෙනෙකු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සමාලෝචිත වර්ෂය තුළ රු.1,076,129 ක් ගෙවීම්කර තිබුණි. |

(ඈ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය 9.3.1 VII වගන්තිය | වැඩ බැලීමේ දීමනාව ගෙවිය හැකි උපරිම කාලය මාස තුනක් වුවද , එම සීමාවන්ට පටහැනිව සංස්ථාව විසින් නිලධාරීන් 06 දෙනෙකු සඳහා වැඩ බැලීමේ වැටුප් ලෙස සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.214,848 ක් ගෙවා තිබුණි. |
| (ii) 2015 මැයි 25 දිනැති පීඊඩී 1/2015 දරන චක්‍රලේඛය | විගණන නියැදි පරීක්ෂාවට අනුව ප්‍රවාහන දීමනාව ලැබීමට හිමිකම් නැති නිලධාරීන් 22 දෙනෙකු සඳහා රු.5,000 බැගින් එකතු වටිනාකම රු.110,000 ක් හා නිලධාරීන් 13 දෙනෙකු සඳහා රු.1,500 බැගින් එකතුව රු.19,500 ක ප්‍රවාහන දීමනා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසය සඳහා ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2015 ජුනි 29 දිනැති අංක PE/2015/04 දරන මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛය | පාර්ලිමේන්තු මැතිවරණ කාලසීමාව තුළදී නිලධාරීන්, සේවකයින් බඳවාගැනීම , උසස් කිරීම හා මාරු කිරීම සිදු නොකළ යුතු වුවද ඊට පටහැනිව 2015 මහ මැතිවරණ කාල සීමාවේදී සංස්ථාව ලිපිකරු පත්වීම් 20 ක් ප්‍රදානය කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**3.1. මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.128,779,340 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.136,861,294 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,081,954 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙහෙයුම් ආදායම් රු.41,970,918 කින් අඩුවී

තිබියදී පරිපාලන වියදම් හා කාර්ය මණ්ඩල පිරිවැය පිළිවෙලින් රු.54,931,047 කින් හා රු.15,466,149 කින් වැඩිවුවද භාණ්ඩාගාරය වෙතින් ලද පුනරාවර්තන ප්‍රදාන රු.120,950,000 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අඛණ්ඩව මූල්‍ය ඌනතාවයක් පැවතුණි. කෙසේ වුවද ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා සේවක පාරිශ්‍රමික සැළකීමේදී 2011 වර්ෂයේ රු.242,400,504 ක් වූ සංස්ථාවේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.657,616,399 ක් වී තිබුණි.

## 3.2 විග්‍රාහත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වසර 05 තුල සංස්ථාවේ මුළු ආදායමෙන් රාජ්‍ය ප්‍රදානවල දායකත්වය සියයට 46.70 සිට සියයට 99.80 දක්වා වැඩිවී තිබුණු අතර ස්වයං උත්පාදිත ආදායම්වල දායකත්වය සියයට 53.29 සිට සියයට 0.14 දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වන වගන්තිය හා 1997 මාර්තු 06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙහි සංශෝධිත ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

- ධීවර වරායන් , නැංගුරම් පොලවල්, මුහුදු ව්‍යුහයන් සහ අනෙකුත් වෙරළ පහසුකම් සැලසුම් කිරීම, සැලසුම් නිර්මාණය කිරීම, ඉදිකිරීම පහසුකම් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම , පාලනය , නඩත්තු කිරීම , කළමනාකරණය කිරීම සහ එමගින් ධීවර කාර්මිකයන්ට හා අනෙකුත් පුද්ගලයන්ට සපයනු ලබන පහසුකම් සඳහා පොදු වරාය ගාස්තු නියම කිරීම සහ අයකිරීම.

- ධීවර යාත්‍රා සඳහා අලුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීම.

- ශීතාගාර, අයිස් යන්ත්‍රාගාර සහ අනෙකුත් ශීතාගාර පහසුකම් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

- ජලය , ඉන්ධන , ලිහිසි තෙල් , විදුලිය , අයිස් හා ශීතාගාර පහසුකම් සැපයීම සහ ධීවර කර්මාන්තය උදෙසා සහ ධීවර කාර්මිකයින්ට ආනුෂංගික වන අනෙකුත් සේවාවන් සැපයීම.

- ධීවර වරායන් , නැංගුරම් පොලවල් , මුහුදු ව්‍යුහයන් , ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය තුළට ගැනෙන අනෙකුත් සංවිධානවලට ආරක්ෂක සේවා විධිවිධාන සැලසීම සහ ඒ වෙනුවෙන් ගාස්තු , කුලී සහ වෙනත් ගෙවීම් අය කිරීම.

- ශ්‍රී ලංකා අනන්‍ය ආර්ථික කලාපය පිළිබඳ මෙහෙයුම් , පාලන සහ ආවේක්ෂණ කටයුතු කිරීම.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ධීවර යාත්‍රා සඳහා අලුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීම නීතිගත සංස්ථාව පිහිටුවීමේ අරමුණක් වුවද , සංස්ථාව විසින් යථෝක්ත අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වූ ක්‍රියාකාරකම් කාර්යසාධන වාර්තාවට අනුව ඉටුකිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම කළ යුතු ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි පින්තාරු කිරීම, කාර්යාලය තුළ කොටස් කිරීම සහ පවතින යටිතල පහසුකම් පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සඳහා රු.මිලියන 10 ප්‍රතිපාදන සලසා තිබුණද 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය සහ භෞතික කාර්යසාධනය පිළිවෙලින් සියයට 4 ක් සහ සියයට 10 ක් විය .

(ii) නාවික ව්‍යුහයක් සහ වරායන්වල වේදිකා නඩත්තු කිරීම වෙනුවෙන් රු.මිලියන 14 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබූ නමුත් , සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය හා භෞතික කාර්යසාධනය පිළිවෙලින් සියයට 21 ක් සහ සියයට 25 ක් වූ අතර , සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබුණි.

(iii) ජල මිනුම් සමීක්ෂණ (Hydrographic Survey) කටයුතු සඳහා රු.500,000 ප්‍රතිපාදන සලසා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මූල්‍ය හා භෞතික කාර්යසාධනය පිළිවෙලින් සියයට 1 සහ සියයට 15 ක් විය. තවද, වර්ෂය තුළ ජල මිනුම් සමීක්ෂණ කටයුතු ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි.

(ඇ) සංස්ථාව යටතේ ක්‍රියාත්මක වූ ධීවර වරායන් 21 න් වරාය 17 ක් ම සමාලෝචිත වර්ෂය තුළ රු.156,235,669 ක මෙහෙයුම් අලාභ ලබා තිබූ අතර ඉන් 13 ක් ම ඉකුත් වර්ෂයේදීද අලාභ ලබා තිබුණි. ගාල්ල , දික්ඕවිට හා බේරුවල යන ධීවර වරාය තුනෙහි මෙහෙයුම් ලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙලින් සියයට 95 ක් සියයට 27 ක් හා සියයට 76 කින් අඩුවී තිබුණි. ඉකුත් වර්ෂයේ ලාභ ලැබූ මිරිස්ස , මෝදර හා කුඩාවැල්ල යන වරායන් සමාලෝචිත වර්ෂයේදී අලාභ ලබා තිබූ අතර ලාභයේ පිරිහීම පිළිවෙලින් සියයට 154 ක් සියයට 136 ක් හා සියයට 299 ක් විය. අලාභ ලබන වරායන්වල අලාභ ලැබීමට හේතූන් අධ්‍යයනය කර ලාභ ලබන තත්ත්වයකට ගෙනඒම හෝ අලාභ අඩුකර ගැනීම හා ලාභය අඩුවෙමින් පවතින වරායන්වල එය වැඩිකරගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) සංස්ථාව ඉදිරිපත් කළ සංයුක්ත සැලැස්ම අනුව 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලාභ ලැබීමට අපේක්ෂා කර තිබුණද , එකී කාලය තුළ අලාභ ලබා තිබුණි. මෙම තත්ත්වය යටතේ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාරව අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම තහවුරු කරගැනීම සඳහා ප්‍රමාදයකින් තොරව ඵලදායී පියවර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ඉහළ කළමනාකාරිත්වයේ අවධානය යොමුවී නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් සයුරි යාත්‍රාව කුලී පදනම මත ලබා දීමට අදාලව සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 23 දින පෞද්ගලික සමාගමක් සමඟ එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව බදුකාර සමාගම විසින් යාත්‍රාව සන්තකයේ තබාගත් දිනකට රු.200,000 බැගින් සමාලෝචිත වර්ෂයේ දින 28 ක් එකතුව රු.5,200,000 ක් බදුකාර සමාගමෙන් අයකර ගතයුතු වුවද , ඉන් රු.1,600,000 ක් පමණක් අයකරගෙන තිබුණි. තවද ගිවිසුම් කොන්දේසි වලට පටහැනිව ඉන්ධන, ජලය , සේවක වැටුප් , අතිකාල හා දීමනා ලෙස ගෙවන ලද රු.1,409,960 ක් ද ඇතුළුව එකතුව රු.5,009,960 පෞද්ගලික සමාගමෙන් අයකර ගැනීමට 2016 ඔක්තෝබර් මාසය වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ධීවර වරායන් 16 ක භෞතික ඉන්ධන තොගය සහ පොත් අගය අතර රු.4,063,630 ක හිඟයක් පැවතුනද , කළමනාකරණය විසින් එකී වෙනස්කම් හඳුනාගෙන අදාල පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දික්ඕවිට ධීවර වරායේ පිහිටුවා ඇති අයිස් යන්ත්‍රාගාරය බදු පදනම මත ලබාගත් පෞද්ගලික පාර්ශවය 2013 ඔක්තෝබර් සිට 2014 පෙබරවාරි දක්වා කාලයට අයවිය යුතු රු.1,848,280 ක බදු මුදල් 2016 ඔක්තෝබර් මාසය වනවිටත් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 හා 2015 යන වර්ෂ 02 තුළ නිමකිරීමට සැලසුම් කර තිබූ මිරිස්ස ධීවර වරාය , හරිත ධීවර වරායක් ලෙස සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රු.මිලියන 30 ක් ප්‍රතිපාදනය කර තිබුණි. ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත පැවරී තිබූ මත්ස්‍ය වෙන්දේසි ශාලාවේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 1.36 වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා හරිත ධීවර වරායක් ලෙස සංවර්ධනය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට කල්බදු ක්‍රමයට අලුතෙන් වාහන මිලදීගැනීම සඳහා රු.මිලියන 8 ක ප්‍රතිපාදන සළසා තිබියදී , අලුතින් වාහන මිලදී නොගෙන සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ පැරණි වාහන අළුත්වැඩියා හා නඩත්තු කටයුතු වෙනුවෙන් රු.මිලියන 9 ක් වැය කර තිබුණි.

(ඊ) 2007 වර්ෂයේදී සැපයුම් අංශයේ රාජකාරි කටයුතු සිදු කළ ලිපිකරු නිලධාරිනියක් රාජ්‍ය මුදල් අවභාවිතා කළ බව ආයතනයේ අභ්‍යන්තර විගණන වාර්තාවක් මගින් පෙන්වා තිබියදී ඒ සඳහා විධිමත් පරික්ෂණයක් කිරිමකින් තොරව ඇය ස්ථාන මාරු කර තිබුණද 2014 වර්ෂයේදී නැවත සැපයුම් අංශයේ කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි.

(උ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.10 ඡේදයට පටහැනිව සංස්ථාව සඳහා අනුමත රු.මිලියන 25 සීමාව ඉක්මවා රු.මිලියන 39 දක්වා බැංකු අයිරා පහසුකම් ලබා ගෙන තිබුණි.

(ඌ) නියමිත දිනට සේවක අර්ථසාධක හා සේවක නියුක්ති භාර අරමුදල් වලට දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාව විසින් එම අරමුදල්වලට පිළිවෙලින් රු.6,432,561 ක හා රු.41,177 ක අධිභාරයන් ගෙවා තිබුණි.

(එ) වාහන දෙකක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී කල්බදු වාරික ගෙවීම ප්‍රමාදවීම නිසා එකතුව රු.1,454,809 ක දඩ පොළියක් ගෙවා තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආසියානු සංවර්ධන බැංකුවේ හා වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ණය ආධාර මත රු.මිලියන 224 ක වියදමින් ඉදිකර සංස්ථාව වෙත ලබා දී ඇති හලාවත ධීවර වරායේ මෙහෙයුම් කටයුතු 2009 වර්ෂයේදී ආරම්භ කර තිබූ නමුත් 2016 ඔක්තෝබර් මාසය දක්වා ධීවර වරායකින් ඉටුවිය යුතු මූලික අරමුණ වන ධීවරයන්ට සහන සැලසීම සිදුවී නොතිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වරායේ මෙහෙයුම් කටයුතු වලින් සිදුවූ අලාභය රු.38,800,732 ක් වූ බැවින් ණය ආධාර මත ඉදිකළ මෙම වරාය වෙනුවෙන් ගෙවීමට ඇති විදේශීය ණය හා ඊට අදාල පොළිය ගෙවීම රජයට වැය බරක් වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ 05 තුළ මුළු මෙහෙයුම් ලාභයෙන් සියයට 73 ක් ඉපැයූ මෝදර ධීවර වරාය, 2014 ඔක්තෝබර් 30 දින සිට වසර 25 ක කාලයකට පෞද්ගලික ආයතනයකට කල්බදු පදනම මත රජයේ තක්සේරුව වූ රු.1,700,000 නොසලකා මාසිකව රු.125,000 බැගින් හෙක්ටයාර් 1.421 ක් වූ ඉඩම හා එහි ගොඩනැගිලි බදු දීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.2,529,915 ක අලාභයක් සිදු වී තිබුණි.

(ඇ) කිරින්ද වරායේ වැලි ඉවත්කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ජුනි මාසයේදී සංස්ථාව සමඟ ගිවිසුම්ගතවී තිබුණු පෞද්ගලික ආයතනය , එම ගිවිසුම පරිදි රු.200,000 ක මුදල තැන්පත් කර නොතිබියදී හා කිරින්ද වරායේ වැලි ඉවත් කිරිම් නිසි පරිදි සිදු නොකළ පෞද්ගලික ආයතනයක් වෙත හම්බන්තොට වරායේ වැලි ඉවත්කිරීම් කටයුතු ද සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ සිට එම ආයතනයටම පවරා තිබුණද , එහි වැලි ඉවත් කිරීමේ කටයුතුද අතහැර තිබුණි.

## 4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්

සංස්ථාව යටතේ ක්‍රියාත්මක ධීවර වරායන් 21 න් වරායන් 15 කට අදාල ඉඩම් පවරා ගැනීමකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදුකර මෙහෙයුම් කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි.

## 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ 45 දෙනෙකු අමාත්‍යාංශය වෙත මුදා හැර තිබියදී සේවය සඳහා පැමිණීමේ වාර්තා ද ලබානොගෙන සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.8,870,163 ක වැටුප් හා වේතන ගෙවා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙනත් රජයේ ආයතනයකින් විධිමත් විනය පරීක්ෂණයකින් සේවයෙන් පහකළ නිලධාරියෙකු 2012 ජනවාරි 04 වන දින මානව සම්පත් කළමනාකරණ තනතුර සඳහා බඳවාගෙන තිබුණි.

(ආ) අනුමත බඳවාගැනීමේ පටිපාටියට පටහැනිව ඉහළ වැටුප් පරිමාණයන්හි පිහිටුවීම නිසා නිලධාරීන් දෙදෙනෙකුට 2012 ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම රු.1,091,800 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 2010 අගෝස්තු 02 දින කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති සම්බන්ධීකාරක තනතුරට වසරක කාලයක් සඳහා බඳවාගත් නිලධාරියෙකු , බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට පටහැනිව මාසයක් තුළ නියෝජ්‍ය කළමනාකාර තනතුරට පත්කර කොන්ත්‍රාත් කාලය තුළ ඔහුගේ කාර්යක්ෂමතාව හා යෝග්‍යතාවය පරීක්ෂාවට ලක් කිරීමකින් තොරව 2012 ජනවාරි 06 දින රු.21,255 ක වැටුප් පියවරෙහි තබා සේවය ස්ථිර කර තිබුණි.

(ඈ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් අහෝසි වූ විදුලි වැඩ මූලික තනතුරෙහි වැඩ බැලීම සඳහා 2013 නොවැම්බර් 15 දින සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා මාසිකව රු.3,652 බැගින් එකතුව රු.83,996 ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි.

(ඉ) නීති අංශයේ සේවකයන් දෙදෙනෙකු වෙත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විශේෂ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.109,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඊ) වාර්ෂිකව රු.3,005,880 ක වැටුප් හා දීමනා ලබන නීතිඥ නිලධාරින් දෙදෙනෙක් ඇතුළුව 07 දෙනෙකු නීති අංශය තුළ සේවයේ යෙදී සිටියදී බාහිර පාර්ශවයන්ගෙන් නීති උපදෙස් ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,108,722 ක් වැයකර තිබුණි.

(උ) අනුමත තනතුරු වලින් පරිබාහිරව සහ නියමිත බඳවාගැනීමේ පටිපාටීන්ට පටහැනිව පත්වීම් 128 ක් ප්‍රදානය කර තිබුණි.

(ඌ) සංස්ථාවේ ප්‍රධාන තනතුරු 05 ක් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාද, වෙනත් තනතුරු 08 ක් 2013 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතීම ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි අයහපත් ලෙස බලපා තිබුණි.

(එ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලයට අනුව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සඳහා නීති නිලධාරී සහ අධ්‍යක්ෂක මණ්ඩල ලේකම් යන තනතුරු එකක් ලෙස දක්වා තිබියදී අධ්‍යක්ෂක මණ්ඩල ලේකම් තනතුර සඳහා 2011 දෙසැම්බර් 02 දින වැඩ බැලීමේ පත්වීමක් ලබාගත් සංස්ථාවේ නීති නිලධාරිණිය 2012 ජනවාරි සිට 2015 දෙසැම්බර් මාසය දක්වා එකතුව රු.420,000 ක දීමනා ලබාගෙන තිබුණි.

**4.7 අභ්‍යන්තර විගණනය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිලධාරීන් දෙදෙනෙකුගෙන් සහ ලිපිකරුවන් හතර දෙනෙකුගෙන් යුත් අභ්‍යන්තර විගණන අංශයක් සංස්ථාවේ පැවතියද , ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2013 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතීම හේතුවෙන් සංස්ථාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134 අනුව අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය උදෙසා අභ්‍යන්තර විගණන අංශය සෘජුවම දෙපාර්තමේන්තු ප්‍රධානියාට වාර්තා කළ යුතු වුවද , සංස්ථාවේ අභ්‍යන්තර විගණක සාමාන්‍යාධිකාරී මගින් අධ්‍යක්ෂක මණ්ඩලයටද ඒ හරහා සංස්ථා සභාපතිටද වාර්තා කරන බව නිරීක්ෂණය විය.

(ඇ) 2009 සැප්තැම්බර් 01 දිනැති අංක ඩීඑම්ජ්/2009(02) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය අනුව අභ්‍යන්තර විගණන අංශය මගින් වත්කම් වාර්තාගත කිරීම සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ අභ්‍යන්තර විගණන ක්‍රියාපටිපාටීන් සකස්කළ යුතු වුවද, 2014 හා 2015 වර්ෂයන් වලදී ඒ පිළිබඳව අවධානය යොමුවී නොතිබුණි. එසේම ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වත්කම් පිළිබඳ විධිමත් වාර්තාවක් 2016 ඔක්තෝබර් මාසය දක්වාම සකස්කර නොතිබුණි.

## 5 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2003 ජුනි 03 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අදාළ ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2016 සැප්තැම්බර් 07 දින දීය.

### 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

------------------------------------

2011 , 2012 සහ 2013 වසරවලට අදාල වාර්ෂික වාර්තා 2016 ඔක්තෝබර් මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

-------------------------------

(අ) (i) සංස්ථාවේ සභාපතිවරයා වෙත 2013 , 2014 හා 2015 ගිණුම් වර්ෂවලට අදාලව ගණුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.116,134,759 ක් වූ විගණන විමසුම් 20 ක් සඳහා 2016 පෙබරවාරි 16 දින දක්වාම පිළිතුරු ලබා දී නොතිබුණි.

(ii) සංස්ථාව විසින් 1996 මැයි 08 දින තාවකාලික පදනම මත කාර්යාල කාර්ය සහායක තනතුරට පත්කළ සේවිකාවක් නියමිත පරිදි රාජකාරී කටයුතු ඉටු නොකිරීම සම්බන්ධයෙන් අවස්ථා 06 කදී ලිඛිත අවවාද කිරීම්වලටද පත්ව තිබියදී හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබියදී ලිපිකරු I ශ්‍රේණියට උසස්වීම් ලබාදී තිබුණි.

(ආ) 2014 පෙබරවාර් 18 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දී තිබූ පහත සඳහන් නියෝග ඉටුකර නොතිබුණි.

(i) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන කඩිනමින් විගණනයට ඉදිරිපත්කිරීමට උපදෙස් දී තිබුණද සමාලෝචිත වර්ෂයේදීද එකී උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි.

(ii) පාඩු ලබන වරායන් ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීම සඳහා කමිටුවක් පත්කර ඊට විසඳුම් සෙවීමට උපදෙස් දී තිබුණද එකී උපදෙස් අනුව කටයුතු කර නොතිබූ අතර, අලාභ තත්ත්වයන් තවදුරටත් වර්ධනය වෙමින් පැවතුනි.

(iii) ඉඩම් හා ගොඩනැගිලි බදු දීමේදී රජයේ තක්සේරුකරුවකුගේ තක්සේරු වාර්තාවක් ලබාගැනීමට නියම කර තිබුණද , එකී උපදෙස්වලට පටහැනිව මෝදර හා පානදුර වරායන් වල ඉඩම් හා ගොඩනැගිලි බදු දී තිබුණි.

(iv) වටිනාකම රු.5,065,075 ක් වූ ඉන්ධන ටැංකි 06 ක් සැපයීම සඳහා 2007 වර්ෂයේදී රු.2,791,215 ක අත්තිකාරම් ගෙවා තිබුණද මෙතෙක් එම ඉන්ධන ටැංකි සංස්ථාවට නොලැබීම පිළිබඳව ඊට වගකිව යුතු සැපයුම් කළමනාකරුට එරෙහිව කටයුතු කිරීමට උපදෙස් දී තිබුණද එකී උපදෙස් අනුව විනය පරීක්ෂණයක් නොමැතිව සහ ගෙවූ මුදල් අයකරගැනීමෙන් තොරව එම සැපයුම් කළමනාකරු නැවත සේවයේ පිහිටුවා තිබුණි.

(v) සංස්ථාවෙන් බාහිර ආයතනවලට නිදහස් කර ඇති සේවකයින් 31 දෙනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට හා කොන්ත්‍රාත් කාලය අවසන් වූ විට සේවය නවතා දැමීමට උපදෙස් දී තිබුණද , ඊට පටහැනිව නිලධාරීන් 45 දෙනෙකු බාහිර ආයතනවල සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සේවයේ යොදවා තිබුණි.

(vi) ණය පදනම මත සැපයූ  ඉන්ධන වෙනුවෙන් අයවිය යුතු මුදල් බාහිර පාර්ශවයන් හා නිලධාරීන්ගෙන් අයකර ගත නොහැකි බැවින් ණය පදනම මත ඉන්ධන නිකුත් නොකිරීමට උපදෙස් දී තිබුණද,  සමාලෝචිත වර්ෂය වනවිට රු.මිලියන 70 ක ඉන්ධන ණය පදනම මත ආයතනයට  ලබාදී තිබුණි.

(vii) මෝදර ධීවර වරාය තුල නැංගුරම් ලා තිබූ යාත්‍රාවෙන් ලැබියයුතු නැංගුරම් ගාස්තු රු.5,675,373 ක් අයකර ගැනීමට උපදෙස් දී තිබුණද 2016 ඔක්තෝබර් මාසය වනවිටත් අයකරගෙන නොතිබුණි.

(viii) සේවක අර්ථසාධක හා  සේවක භාරකාර අරමුදල් සඳහා දායකයන්  නියමිත දිනට ගෙවීමට උපදෙස් දී තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද එකී උපදෙස් ඉටුකර නොතිබුණි.

(ix) නව නිලධාරින් බඳවාගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ වලට පටහැනිව වැටුප් වැඩිවීම් ලබා දී තිබුණු බැවින් ඒ සඳහා විශේෂ  අනුමැතියක් ලබාගැනීමට හා  බඳවාගැනීමේ පටිපාටිය සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු සිදුවී නොතිබුණි.

(x) අත්තිකාරම් පියවීම සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියෝග කර තිබුණද එකී නියෝග 2016 ඔක්තෝබර් මාසය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මුල්‍ය පාලනය | (i) බැංකු සැසඳුම් ප්‍රකාශනවල නොසැසඳීම් පැවතීම හා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ ප්‍රමාදයන් පැවතීම.<br>(ii) සීමාව ඉක්මවා  බැංකු අයිරා පහසුකම් ලබාගැනීම නිසා අයිරා පොළී විශාල  වශයෙන් ගෙවීමට සිදුවී තිබීම. |
| (ආ) ආදායම් පාලනය | - ආදායම් අයකර ගැනීම දුර්වල  තත්ත්වයක පැවතීම හා හිඟ ආදායම් වසර ගණනාවක සිට අයකර ගැනීමට පියවර නොගැනීම. |
| (ඇ) කාර්ය  මණ්ඩල පරිපාලනය | - බඳවාගැනීමේ පරිපාටි අනුමත කරගෙන නොමැති වීම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව වැටුප් වැඩිවීම් හා බඳවාගැනීම් සිදුකර තිබීම. මානව සම්පත් කළමනාකාර අධ්‍යක්ෂකගේ පත්වීම විධිමත් නොවීම. සේවක අතිරික්තයක්  තිබීම. |

| | |
|---|---|
| (ඇ) වත්කම් පාලනය | - ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොමැතිවීම හා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදුකර නොතිබීම. |
| (ඉ) වාහන පාලනය | - වාහන අනතුරු අලුත්වැඩියා විධිමත් නොවීම හා අලුත්වැඩියා වියදම් අධික වීම. |
| (ඊ) අභ්‍යන්තර විගණනය | - ප්‍රධාන අභ්‍යන්තර විගණක බඳවා නොගැනීම නිසා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුනොවීම හා අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දී නොමැතිවීම. |